**රුහුණ විශ්වවිද්‍යාලය**
**2016/2017 ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධි 3000 ස්ථලය**
**පළමු සමාසික පරීක්ෂණය - 2017 ඔක්තෝබර්/නොවැම්බර්**

# SLS 31623 - ඓතිහාසික වාග්විද්‍යාව

**ප්‍රශ්න <u>පහකට (05)</u> පමණක් පිළිතුරු සපයන්න.**
නොපැහැදිලි අත්අකුරුවලට ලකුණු අඩු කෙරේ.

**කාලය : පැය 03 යි.**

---

01. පෙරදිග වාග්විද්‍යාව පෝෂණයෙහිලා භාරතීය ව්‍යාකරණඥයන්ගේ දායකත්වය පහදන්න.

02. භාෂා වර්ගීකරණය (Classification of Languages) යන සංකල්පය හඳුන්වා ඥාති සම්බන්ධය (Genealogical) මත භාෂා වර්ග කළ හැකි ආකාරය නිදසුන් ඇසුරෙන් සාකච්ඡා කරන්න.

03. පුරාතන ඉන්දු - ආර්ය (Old Indo - Aryan) යුගයේ භාෂා ලක්ෂණ උදාහරණ සහිත ව පහදන්න.

04. "සිංහල භාෂා පරිණාමයේ වැදගත්ම අවධිය ලෙස සැලකිය හැක්කේ මධ්‍යතන යුගයයි." සකාරණව සනාථ කරන්න.

05. පුරාතන ඉන්දු ආර්ය ස්වරමාලාව සිංහලයෙහි නිරූපණය වන්නේ කෙසේදැයි නිදර්ශන සපයමින් සාකච්ඡා කරන්න.

06. අතිදේශය (Analogy) යන සංකල්පය හඳුන්වා එය සිංහල භාෂා ප්‍රගමනය උදෙසා බලපාන අයුරු පහදන්න.

07. සිංහල භාෂාවේ වාක්කෝෂය පුළුල් වීමෙහිලා ඍණීකරණය (Barrowing) බලපා ඇති ආකාරය නිදර්ශන සහිතව විමසන්න.

08. පහත සඳහන් මාතෘකා අතුරින් දෙකකට ඓතිහාසික වාග්විද්‍යානුකූල විවරණ සපයන්න.

I. තුලනාත්මක භාෂා ප්‍රතිනිර්මාණ න්‍යාය (Comparative Method)
II. භාෂාවේ ක්‍රමික හා ක්ෂණික ශබ්ද පරිණාමය (Regular and Sudden Sound Changes of a Language)
III. දක්ෂිණ ද්‍රාවිඩ භාෂා (Southern Dravidian Languages)
IV. ලිඛිත වාර්තා (Written Records)

(සෑම පිළිතුරකට ම ලකුණු 12 බැගිනි.)

@@@@@@@@

114